## පස්සර ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 04 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 27 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

#### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, පස්සර ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.13,333,442 ක් වූ ගිණුම් ශේෂයන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 මූල්‍ය පාලනය

(අ) 1996 හා 2004 වර්ෂවල සිට පැවත එන රු.75,712 ක් වටිනා අගරු චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව අදාල කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයට පෙර අවස්ථා 02 කදී දෙන ලද රු.64,496 ක අත්තිකාරම්, මුදල් රෙගුලාසි 371ප්‍රකාරව පියවාගෙන නොතිබුණි.

#### 2.2 ආදායම් පරිපාලනය

##### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 2,855 | 2,406 | 1,608 |
| (ii) | බදු කුලී | 9,407 | 9,504 | 901 |
| (iii) | වෙනත් ආදායම් | 5,223 | 1,447 | 5,773 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 5,057,794 |
| (ii) | මුද්දර ගාස්තු | 5,327,195 |

### 2.2.3 කඩ කුලී

2005 වසරේ සිදුකළ තක්සේරුවට අනුව කඩ කුලී අය නොකිරීම හේතුවෙන් 2005 නොවැම්බර් සිට 2011 දෙසැම්බර් 31 තෙක් සභාවට අහිමිවී තිබූ ආදායම රු.1,491,100 ක් විය.

### 2.3 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

2008 හා 2009 වර්ෂවල සිට නිෂ්කාර්යව පවතින සභාව සතු වාහන දෙකක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන ස්වේච්ඡා සංවිධාන සඳහා කුඩාරම් රෙදි ලබාදීම සඳහා සභා අරමුදලින් රු.46,500 ක් වැයකර තිබුණි.

### 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව දෛනික දීමනා මත සේවය කළ සේවකයින් 05 දෙනෙකු සඳහා සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු රු.46,872 ක දායක මුදල් ගෙවා නොතිබුණි.

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව දෛනික දීමනා පදනම මත සේවය කළ සේවකයින් 05 දෙනෙකු සඳහා සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.7,031 ක් ගෙවා නොතිබුණි.